# පාර මනෝවිද්‍යාව පිළිබඳ බෞද්ධ විග්‍රහය

ජී. හල්ගස්වත්ත

2007 මැයි

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

කැළණිය විශ්වවිද්‍යාලය

## සාරාංශය

මෙම පර්යේෂණ ව්‍යාපෘතිය මූලික වශයෙන් බුදුදහම හා නූතන පාර මනෝවිද්‍යාව පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයකි. බුදු දහම පිළිබඳව ඉතා ඈත අතීතයේ සිට ම ලියැවී ඇති කෘති, අප්‍රමාණ සංඛ්‍යාවක් ඇති අතර නව විෂයක් වුවක් පාර මනෝවිද්‍යාව පිළිබඳව ලියැවී ඇති කෘති සංඛ්‍යාව අති විශාලය. මෙම විෂය දෙක ම පිළිබඳව ලොවපුරා විවිධ භාෂාවලින් විවිධ කෘති ලියැවී ඇත.

පොදුවේ මෙම කෘතිවල දක්නට ඇති ලක්‍ෂණයක් නම්, බුදු දහමෙහි අතීන්ද්‍රීය ප්‍රත්‍යක්‍ෂයෙන් දැන ගැනීමට හැකි මරණය හා මරණාසන්න අත්දැකීම්, පුනර්භවය හා අන්තරාභවය, මනෝකාය, කර්මය, හා එහි විපාක, අමනුෂ්‍ය සත්ව කොට්ඨාස වැනි කරුණු පිළිබඳව පාර මනෝවිද්‍යාව ආධාරයෙන් කරුණු ඉදිරිපත් කිරීමය. නවීන විද්‍යාව (බටහිර විද්‍යාව) භෞතික අංශය ගැන පමණක් අවධානය යොමු කරන නිසා එයින් මිනිසාගේ ප්‍රශ්න සම්පූර්ණයෙන් විසඳා ගැනීමට හැකි වී නැත. එබැවින් බුදු දහමේ සඳහන් නාම, රූප යන අංශ දෙකෙන් රූප කොටස පමණක් ගැන කතාකරන නවීන විද්‍යාව (බටහිර), දැන් දැන් නාම කොටස ගැන අවධානය යොමු කරන්නට පටන්ගෙන ඇත. මේවා ප්‍රතික්ෂේප කරන භෞතික විද්‍යාඥයන් සිටිය ද, විවෘතව හා මධ්‍යස්ථව සිතන විද්‍යාඥයන් නිසා මනෝ විද්‍යා ක්ෂේත්‍රයට පාර මනෝ විද්‍යාව (Para Psychology) යනුවෙන් ක්ෂේත්‍රයක් බිහි වී ඇත. මෙම නිබන්ධයෙන් මා සාකච්ඡා කරන්නේ, බුදු දහමේ සඳහන් අභිඤ්ඤා වැනි උසස් ඥාන මාර්ග හා කොතරම් දුරට පාර මනෝ විද්‍යාවේ දැනට සොයාගෙන ඇති කරුණු සමග තුලනයවේ ද? නවීන විද්‍යාව සම්පූර්ණ වීමට, නව ඥානයක් බුදු දහම ඇසුරින් ලබා ගත හැකි ද? එමගින් දැනට ඇතිවාට වඩා ශාන්තියක්, සැනසීමක් හා සදාචාරාත්මක සංවර්ධනයක් මිනිසාට ඇති කර ගත හැකි ද? යන්නයි.

ආරම්භක පරිච්ජේදයේ දී මූලික හැඳින්වීම කෙරෙන අතර මේ පිළිබඳව ලියවී ඇති පොතපත ගැන සාහිත්‍ය සමාලෝචනයක් කෙරේ. 2 වන පරිච්ජේදයේ දී මූලික සංකල්ප නිරවුල් කරගැනීම සිදුවේ. එහිදී ආගම යනු කුමක් ද? බුදු දහම යනු කුමක් ද? විද්‍යාව යනු කුමක් ද? පාර මනෝවිද්‍යාව යනු කුමක් ද? බුදු දහම හා නවීන විද්‍යාව (පාරමනෝවිද්‍යාව) සන්සන්දනය කිරීම සිදුවේ. 03 වන පරිච්ජේදයේ දී බුදු සමයේ ඥානය හා ඥානමාර්ග පාර මනෝවිද්‍යාව සමග තුලනය කෙරේ. මෙහි දී ඥානය පිළිබඳ බෞද්ධ විග්‍රහය

මුලින් සිදුවන අතර අභිඤ්ඤා පිළිබඳ විශේෂ අවධානයක් සිදු වේ. පුබ්බේනිවාසානුස්සති, චුතුපපාත, දිබ්බචක්ඛු ඥානයන් මගින් ඇති කර ගන්නා දැනීම, මරණය හා පුනර්භවය විමසීමේදී වැදගත් වන නිසා 4 වන පරිච්ඡේදයේදී මරණය හා මරණාසන්න අත්දැකීම් පිළිබඳ විමසීම සිදුවේ. මේ පළිබඳ තවදුරටත් කරුණු විග්‍රහය 5 වන පරිච්ඡේදයේ දී සිදුවේ. එහි දී පුනර්භවය හා අන්තරා භවය ගැන සාකච්ඡා කෙරේ. අන්තරාභවය පිළිගත් පමණින් ආත්මවාදියෙකු නොවන බවත් කුසල අකුසල කර්ම මෙයට සම්බන්ධ වන අයුරුත් සාකච්ඡා කෙරෙන අතර, මේ හා සම්බන්ධ මනෝමය කය පිළිබඳව 6 වන පරිච්ඡේදයේ දී අවධානය යොමු කර ඇත. 7 වන පරිච්ඡේදයේ දී කර්මය හා විපාකය පිළිබඳ කෙරෙන සාකච්ඡා තුළින් 4, 5, 6, යන පරිච්ඡේදවල විස්තර වූ කොටස් ගැන තව දුරටත් අවබෝධයක් ලබාගත හැක. කර්ම විපාක දිගින් දිගට බලපාන ආකාරය ද? මෝහනය හා ප්‍රතිගමනය මගින් කර්මය හා පුනර්භවය තහවුරු වේ ද යන්නත් මෙහිදී සාකච්ඡා කෙරේ. 8 වන පරිච්ඡේදයේ දී නිගමනය කුමක්දැයි දක්වා ඇත. එහිදී දැනට ඇති ඥානයට නව ඥානයක් බුදු දහම තුළින් ලබාගෙන, දැනට ඇතිවාට වඩා සදාචාර සංවර්ධනයක් තුළින් මිනිසාට සැනසීමක්, ශාන්තියක් ඇති කර ගැනීමට යොමු වීමක් සිදුවේ.